පොදුවේ සමාජයේ දුබල පාර්ශවයන් ලෙස ගැනෙන දරුවන්, කාන්තාවන් හා වැඩිහිටි තැනැත්තන් බල ගැන්වීම හා ඔවුන්ගේ නෛතික රැකවරණය හා ආරක්ෂාව සුරක්ෂිත කිරීම උදෙසා මූලික අවධානය යොමු කිරීම මේවායේ අපේක්ෂාවයි.

එසේම ශක්තිමත් හා කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් බිහි කිරීම උදෙසා නෛතික සාක්ෂරතාවය ලබා දීමට රජයේ ක්ෂේත්‍ර නිලධාරීන්, පොලිස් නිලධාරීන්, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් වැනි පිරිස් ඉලක්ක ගත කණ්ඩායම් වශයෙන් හඳුනා ගෙන ඇත.

තව ද සුභසාධක රජයක් ලෙස අවධානයට පාත්‍ර විය යුතු සුවිශේෂී කොටස් වශයෙන් හඳුනා ගෙන ඇත්තේ බන්ධනාගාර රැඳවියන්, ආදී වාසීන්, විදේශගත ශ්‍රමිකයින් ය.

## B.1. පාසල් වැඩසටහන්

ඕනෑම ආකාරයක දැනුම සමාජ ගත කිරීම සඳහා සුදුසුම වයස හා කණ්ඩායම පාසල් සිසු දරුවන් වේ. ඉගෙන ගන්නා වයසේ දරුවන් තුළ ඇති කුතුහලය, දැනුම ලබා ගැනීමේ පිපාසය හා නව දැනුම සොයා යෑමට ඔවුන් තුළ ඇති රුචිකත්වය අභිප්‍රේරණය කිරීමෙන් ළමයා හරහා වැඩිහිටි සමාජයත් දැනුවත් කිරීම ඉතා පහසුය. මේ සංකල්පය ඔස්සේ විකාශය වූ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ පාසල් වැඩසටහන් අංශය විසින් ආකාර කිහිපයක් ඔස්සේ පාසල් වැඩසටහන් දියත් කරන ලදී.
එසේම දරුවන්ට අධ්‍යාපනය ලැබීමේ අයිතිය ආදරය ලබා ගැනීමේ හා රැකවරණය ලබා ගැනීමේ අයිතිය, අපරාධ වලින් දරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා අවශ්‍ය දැනුම දරුවන් වෙත ලබා දීම මෙම වැඩසටහන් වල දී ආවරණය කරනු ලැබිණි. දිවයිනේ විවිධ ප්‍රදේශ වල අතිදුෂ්කර පාසල් විෂයයෙහි මෙම වැඩසටහන් ක්‍රියාත්මක කෙරුණි.

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ ළමයින් සඳහා වූ විශේෂ ඒකකය අවධානයට පාත්‍ර වී ඇති ළමයින් සඳහා වූ නඩත්තු නඩු ගණන 19733 කි. මෙම වසරේ දී පාසල් වැඩසටහන් 10 ක් සිදු කර ඇති අතර ඒ සඳහා සහභාගී වූ පාසල් සිසුන් සංඛ්‍යාව 1033 කි.

## B.2. කාන්තාවන් සඳහා වූ වැඩසටහන්

ග්‍රාමීය කාන්තාවන්, අර්ධ නාගරික හා නාගරික කාන්තාවන් සියළු දෙනාම පාහේ කේන්ද්‍ර කර ගනිමින් මෙම වැඩසටහන් දියත් කෙරේ. මෙහි දී කාන්තාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සේම ඇයට එරෙහිව සිදු වන සෑම සියළු ආකාරයකින්ම ප්‍රචන්ඩ ක්‍රියාවන් වලින් ආරක්ෂා කර ගැනීම සඳහාත් වන නීති කෙරෙහි අවධානයට ලක් කරමින් වැඩසටහන් හා අවශ්‍ය අවස්ථාවන්හිදී නෛතික රැකවරණය ලබා දීම මෙයින් සිදු කරනු ලැබේ.

කාන්තාවන් සඳහා වූ වෙනමම නීති ආධාර ඒකකයක් නීති ආධාර කොමිෂන් සභාවේ ක්‍රියාත්මක වේ. මෙම ඒකකය මඟින් 2019 වර්ෂයේ නීතිමය උපදෙස් ලබා දුන් කාන්තාවන් ගණන 27994 කි. දැනුවත් කිරීමේ වැඩසටහන් 08 කි.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධව විවිධ වැඩසටහන් ලංකාවේ විවිධ ප්‍රදේශ වල ක්‍රියාත්මක කිරීමත් එහි දී එදිනෙදා ජීවිතයට බලපාන නීති තත්ත්ව දේපළ ආරක්ෂා කිරීම් සම්බන්ධව වූ නීතින්, නඩත්තු, ගෘහස්ථ ප්‍රචන්ඩත්ව, දික්කසාද, මූලික අයිතිවාසිකම්, කම්කරු නීති කෙරෙහි කාන්තාවන්ගේ විශේෂ අවධානයට ලක්කරනු ලැබ ඇත. නීති දැනුම ලබා දීමේ වැඩසටහන්, විවිධ කතිකාවත්, නීති ආධාර ලබා ගැනීම සඳහා ප්‍රවේශ වීමට මග පෙන්වීමත් මෙහි ලා සිදු කරනු ලැබ ඇත.

එසේම මෙම වසර තුළ දී ජාතික කාන්තා කමිටුව නියෝජනය කිරීමට ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවට හැකි විය.

## B.3. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා වූ වැඩසටහන්

ලෝකයේ දියුණු වෙමින් පවත්නා රටවල් අතර ඉතා සිඝ්‍රයෙන් වියපත් ජනතාවක් බිහිකරන රටක් ලෙසට හැඳින්වෙන ශ්‍රී ලංකාව ඉතා සුවිශේෂී ජනගහන විද්‍යාත්මක විපර්යාසයකට මුණ දෙමින් සිටී. රටේ සමස්ථ ජනගහනයෙන් 1/10 ක් පමණ වන වැඩිහිටි ජනගහනය වර්ෂ 2050 පමණ වනවිට දෙගුණයකින් වැඩි වර්ධනයක් වන බවට ජනගහන විද්‍යාඥයින් විසින් අනාවැකි පලකර ඇත. රටක ආයු අපේක්ෂාව ඉහල යාම හෝ වියපත් ජනගහනය වැඩි වීම එක් අතකින් සංවර්ධිත රටක ලක්ෂණ පෙන්නුම් කරන්නක් වුවත් වැඩි වන වැඩිහිටි ජනගහනයට සාපේක්ෂව අවශ්‍ය අනෙකුත් සුභසාධන පහසුකම් වර්ධනය නොවීම එක්තරා අතකින් අභියෝගයකි.

පිරිස් බලයෙන් ඉතා ඉහල මෙන්ම මෙම පිරිස අත්දැකීමෙන් මෙන්ම දැනුමෙන් ද සන්නද්ධ කණ්ඩායමක් බවට පත් කිරීමෙන් ඉතා සාධනීය ප්‍රතිපල නෙලා ගත හැකි බව ප්‍රායෝගිකව ඔප්පු කර හරමාය.

වසර 30 ක යුද්ධයක් තිබූ ශ්‍රී ලංකාවේ සමාජය තුළ ජ්‍යෙෂ්ඨ පුරවැසි ජනගහනය සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගෙන ඇති අතර සමාජ සුභ සාධක සංකල්පය බලගැන්වීම හා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය උදෙසා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ ආරක්ෂාව හා රැකවරණය පිළිබඳ සහතියක් තිබිය යුතුය. මුළු ජනගහනයෙන් 11% ක් වන ජ්‍යෙෂ්ඨ පුරවැසි ප්‍රජාව, ඡන්ද හිමියන්ගෙන් 20% කි. එම තත්ත්වය තුළ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් වර්ෂ 2000 අංක 09 දරණ වැඩිහිටියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත නීති ගත කිරීම තුළ එකී වටිනාකම තහවුරු කර ඇත.

මෙවන් පසුබිමක් තුළ ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව ස්වකීය ජ්‍යෙෂ්ඨ පුරවැසි නීති අංශයේ කටයුතු ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබ ඇත. ප්‍රාදේශීය මට්ටමින් පවත්නා වැඩිහිටි සංගම් වල සාමාජිකයන්ගේ නීතිමය ගැටළු වලට නොමිලේ විසඳුම් ලබා ගැනීමට සහාය දීමත් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය විසින් ලබා දී ඇති වැඩිහිටියන්ට නඩත්තු ලබා ගැනීම සම්බන්ධයෙන් වූ නියෝග මහේස්ත්‍රාත් අධිකරණය මඟින් බලගන්වා ගැනීමේ ක්‍රියාවලියත් ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව මඟින් සිදු කරනු ලැබේ. එසේම ප්‍රාදේශීකව පවත්නා බිම් මට්ටමේ වැඩිහිටි සමිති වල සාමාජිකයින් සඳහා නීතිය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් සිදු කරනු ලැබේ. 2019 වර්ෂයේ දී ජ්‍යෙෂ්ඨ පුරවැසියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 08 ක් පවත්වා ඇති අතර ඒ සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් 730 ක් සහභාගී වී ඇත.

## B.4. රජයේ නිලධාරීන් සඳහා වූ වැඩසටහන්

පොදුවේ සමස්ථ රාජ්‍ය නිලධාරීන් කෙරෙහිම අවධානය යොමු කරමින් නීති දැනුම ලබා දීමේ වැඩසටහන් සිදු කරන අතරම සුවිශේෂී ක්ෂේත්‍ර වල නිරත වන නිලධාරීන් අරභයා ද නීති දැනුම ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක වේ. රාජ්‍ය නිලධාරීන්ගේ වෘත්තීය නිපුණත්වය වැඩි දියුණු කිරීමත්, කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් බිහි කිරීමත් නීති ගරුක අවංක තෘප්තිමත්

රාජ්‍ය සේවකයක් නිර්මාණය කිරීමත් උදෙසා නීති ආධාර කොමිෂන් සභාව විසින් ඉටු කළ යුතු කාර්ය භාරයක් ලෙසට මෙය සිදු කෙරේ.
කොමිෂන් සභාවේ ව්‍යාපෘති අංශය සහ ප්‍රාදේශීය නීති ආධාර කොමිෂන් සභා කාර්යාල එකතුව මේවා දිවයින පුරා විවිධ රාජ්‍ය, අර්ධ රාජ්‍ය සහ පළාත් රාජ්‍ය කාර්යාල වල සිදු කරනු ලැබ ඇත.
මෙහි දී පරිපාලන නීතිය, මානව හිමිකම් නීතිය, ඉඩම් සම්බන්ධ නීති තත්ත්ව, අල්ලස් හා දූෂණ නීතිය, කම්කරු නීතිය, පවුල් හා බැඳි නීතීන් කෙරෙහි අවධානයට ලක්කොට ඇති ක්ෂේත්‍ර වේ. දේශණ මඟින් වැඩසටහන් සිදු කිරීමත්, පුහුණු පාඨමාලා සහ නිබන්ධන තුළින් දැනුම සම්ප්‍රේශණය කිරීම සඳහා කටයුතු කර ඇත.

සමස්ථයක් වශයෙන් ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාර නිලධාරීන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සිටින ක්ෂේත්‍ර නිලධාරීන් මෙම වැඩසටහන් වල දී ඉලක්ක ගත කණ්ඩායම් වශයෙන් හඳුනාගෙන ඇත.
ඒ අනුව වැඩසටහන් 13 ක් ඒකාබද්ධ අරමුදල මඟින් සිදු කරන ලදී.

## B.5. <u>පොලිස් නිලධාරීන් සඳහා වූ වැඩසටහන්</u>

නීතිය හා සාමය ආරක්ෂා කිරීමෙහි ලා විශාල කාර්ය භාරයක් සිදු කරන රාජ්‍ය නිලධාරී තන්ත්‍රය පොලිස් සේවයයි. පොලිස් සේවයේ නිරත සියළු නිලධාරීන් අධිකරණ කටයුතු හා නීති ක්ෂේත්‍රය පිළිබඳ හොඳ අවබෝධයකින් හා දැනුමකින් යුක්ත විය යුතුය. පොලිස් සේවයට නිලධාරීන් බඳවා ගන්නා අවස්ථාවේ දී නීති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා දෙන නමුත් සේවයේ නිරත වූවායින් අනතුරුව විවිධ අවස්ථාවන් හි දී සිදු කරනු ලබන නෛතික සංශෝධන හා අලුත් අණ පනත් හා නීති රෙගුලාසි පිළිබඳව ඔවුන් ලබා ගන්නා දැනුම සීමිතය. එම දැනුම එක් රැස්කර ගැනීමට ලැබෙන අවස්ථාවන් ද සුලභ නොවේ.

එහෙයින් පොලිස් නිලධාරීන්ගේ වෘත්තීය නිපුණත්වය වර්ධනය කිරීම සඳහා නීති දැනුම ලබා දීමේ වැඩසටහන් සිදු කළ යුතුව ඇත. මේ සඳහා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව ඒකාබද්ධව දිවයින පුරා විවිධ පොලිස් ස්ථාන වල සේවයේ නියුතු නිලධාරීන් නීතිමය දැනුම පිළිබඳව දැනුවත් කිරීමේ හා පුහුණු කිරීමේ වැඩසටහන් කලක් තිස්සේ සිදු කරමින් පවති. අපරාධ නීති ක්ෂේත්‍රය සේම, සිවිල් හා පරිපාලන නීති ක්ෂේත්‍ර වල දැනුමත් පොලිස් නිලධාරීන්ට ලබා දීම මෙහි දී සිදු කරනවා ඇත.

## B.6 <u>වෛද්‍ය නිලධාරීන් සඳහා වූ වැඩසටහන්</u>

ස්වකීය වෘත්තිමය ක්ෂේත්‍රයේ සෑම අවස්ථාවන් හි දීම නීතිය සමඟ ගනුදෙනු කිරීමට සිදු වූවත් වෙනත් රාජ්‍ය නිලධාරීන් හා සාපේක්ෂව බලන කල නීති ක්ෂේත්‍රය පිළිබඳ දැනුම ලබා ගැනීමට ඇති අවස්ථා අල්ප වශයෙන් ඇති රාජ්‍ය නිලධාරී කාණ්ඩයකි වෛද්‍ය නිලධාරීන්. යම් අවස්ථාවන් හි දී අධිකරණ කටයුත්තකට සහාය වීමට වෛද්‍ය නිලධාරීන්ට සිදු වූවත් එම කටයුතු වලට සහය විය යුතු ආකාරය පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා ගැනීමට අවස්ථාව ලැබෙන්නේ වෛද්‍යවරුන්ගෙන් ස්වල්ප දෙනෙකුට පමණි. බොහෝ අධිකරණ වෛද්‍ය නිලධාරීන්ට මුහුණ පෑමට සිදු වන බැරෑරුම් ප්‍රශ්නයකි එය.

මරණ පරීක්ෂණ වල දීත් ඒ සම්බන්ධයෙන් සාක්ෂි ලබා දීමට අධිකරණ වලට පැමිණෙන අවස්ථාවන් හි දීත් අධිකරණමය කටයුතු වලට අවශ්‍ය වන විශේෂඥ සාක්ෂි ලබා ගන්නා අවස්ථාවන් හි දීත් නඩු භාණ්ඩ එකතු කිරීම හා ඉදිරිපත් කිරීම හා විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙනුත් අධිකරණ වෛද්‍ය නිලධාරීන්ට මුහුණ පෑමට සිදු වන්නේ බැරෑරුම් අභියෝගයන්ට ය.

එසේම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ට ද තම වෘත්තීය ක්ෂේත්‍රයේ දී බොහෝ අවස්ථා වල අධිකරණමය කටයුතු වලට සහය වීමට සිදු වුවත් නීති ක්ෂේත්‍රය පිළිබඳ අවබෝධය අල්පය. එහෙයින් වෛද්‍ය වෘත්තිකයින් නීතිය පිළිබඳ දැනුවත් කිරීම වෘත්තීයභාවය වැඩිදියුණු කිරීමක් සේම සමාජ සාධාරණත්වය සුභ සාධනය හා යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට මහෝපකාරී වන්නකි.

වෛද්‍ය වෘත්තිකයින් නීතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා සේම නීති වෛද්‍ය සායන පැවැත්වීම මඟින් මහජනතාවට සුවිශේෂී කාර්ය භාරයක් සිදු කිරීම ද මේ හරහා කටයුතු කර ඇත. බෝනොවන රෝග වැලැක් වීමේ ප්‍රජා සෞඛ්‍ය සත්කාරයේ දී වෛද්‍ය වෘත්තිකයින් සමඟ අත්වැල් බැඳ ගනිමින් දිවයින පුරා පිහිටි ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ කාර්යාල වල නිලධාරීන් කටයුතු කරනු ලැබ ඇත.

## B.7 ජංගම නීති සායන

නීති ආධාර කොමිෂන් සභාව පිහිටුවීමේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීමේලා ඉතාම වැදගත් ව්‍යාපෘතිය ජංගම නීති සායන පැවැත් වීමයි. මේ තුළින් නීති ආධාර වැඩපිළිවෙල බිම් මට්ටමේ ප්‍රජාව අතර ව්‍යාප්ත කිරීමත්, ගැටළු හඳුනා ගැනීම, පොදු මහජනතාව යුක්තිය කරා ප්‍රවේශ කිරීම වඩා පහසු කර වීම සිදු වනවා ඇත. දිවයිනේ පිහිටා ඇති ප්‍රාදේශීය නීති ආධාර කාර්යාල හරහා මෙම වැඩ පිළිවෙල බිම්මට්ටමෙන් ක්‍රියාත්මක වේ. අඩු ආදායම්ලාභී ජනතාව වෙනුවෙන් නොමිලේ නීතිඥ සහාය ලබා දීම සඳහා සුදුසු තැනැත්තන් හඳුනා ගැනීම මේ කාර්යයෙන් වඩාත් පහසු කරවනු ලැබේ. ජංගම නීති සායන 56 ක් සිදු කර ඇත.

**1.3.2 දැනුවත් කිරීම සඳහා වූ සමාජ සහභාගීත්ව වැඩසටහන් 2019 - මෙම වර්ෂය තුළ දී පවත්වා ඇති වැඩසටහන් හා එහි බෙදීයාම පහත පරිදි වේ.**

| | වැඩසටහන | වැඩසටහන් ගණන |
|---|---|---|
| 01 | නෛතික දැනුම ලබා දීම, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, වරප්‍රසාද ලබා ගැනීමට සහයෝගය දැක්වීම උදෙසා ළමයින්, කාන්තාවන්, වැඩිහිටියන් හා ආබාධිත ප්‍රජාව කේන්ද්‍ර කොට ගනිමින් පැවැත් වූ වැඩසටහන් | 38 |
| 02 | නෛතික දැනුම ලබා දීම තුළින් ගුණාත්මක සහ කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීමෙන් මහජනතාවට යුක්තිය කරා පහසුවෙන් ප්‍රවේශ වීමේ අපේක්ෂාව පෙර දැරිව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 12 |
| 03 | ආරාධිත දේශන හා නීති උපදේශන මඟින් සම්පත් දායකත්වය ලබා දුන් වැඩසටහන් | 79 |
| 04 | වතුකම්කරුවන්, ධීවර ප්‍රජාව, මුඩුක්කු හා පැල්පත් වාසීන් අරමුණු කොට සිදු කරනු ලැබූ වැඩසටහන් (නාගරික සංවර්ධන අධිකාරිය සමඟ කරන ලදී) | 01 |
| 05 | බන්ධනාගාර වැඩසටහන් | 12 |
| 06 | ග්‍රාමීය ප්‍රාව දැනුවත් කිරීම | 28 |
| 07 | නීති ආධාර සායන | 28 |
| 08 | ආධුනික නීතිඥවරුන් පුහුණු කිරීමේ වැඩමුළු | 01 |
| 09 | මතින් නිදහස් රටක් නිර්මාණය කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ මෙහෙයවීම මත මත්ද්‍රව්‍ය, නිවාරණය, හා ප්‍රතිකාර යන මැයෙන් මත්ද්‍රව්‍යයන් සඳහා ඇබ්බැහි වූ පවුල්වන සාමාජිකයින් නීතිමය හා වෛද්‍යමය වශයෙන් දැනුවත් කිරීම | 04 |
| 10 | තොරතුරු දැනගැනීමේ පනත සම්බන්ධයෙන් වන වැඩසටහන් (පොලීසිය, ග්‍රාම නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් කොළඹ මහනගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු විධායක නිලධාරීන්, විදුලි ඉංජිනේරුවරුන්, විශ්ව විද්‍යාල සිසුන්, වැඩිහිටි ප්‍රජාව වෙත මෙම වැඩසටහන් දියත් කරන ලදී.) | 08 |
| 11 | අධිකරණ අමාත්‍යාංශය හා නීති ආධාර කොමිෂන් සභාව එක්ව සංවිධානය කරනු ලබන රට වෙනුවෙන් එකට සිටිමු යන වැඩසටහනේ ආබාධිත ප්‍රජාව හා වැඩිහිටි ප්‍රජාව සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ සිදු කල වැඩසටහන් | 05 |
| 12 | අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් රාජ්‍ය සේවය ගමට යන තේමාව යටතේ සිදු කරනු ලබන වැඩසටහන් මාලාවේ මාතලේ දිස්ත්‍රික්කයේ වැඩසටහන් සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥවරුන්ගේ සම්පත් දායකත්වය ලබා දීම | 08 |
| 13 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොළඹ, ගම්පහ, රත්නපුර, කළුතර දිස්ත්‍රික්ක වල සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 03 |
| 14 | කාන්තා දිනයට සමගාමීව මාර්තු මාසය තුළදී කාන්තාවන් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 07 |
| 15 | වයඹ විශ්ව විද්‍යාල සංවත්සරික වෙනුවෙන් කරන ලද අධ්‍යාපනික ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටියක් පැවැත්වීම | 01 |
| 16 | ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ දායකත්වය ලබා දීම | 06 |
| 17 | එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ සහභාගීත්වය | 02 |

| | | |
|---|---|---|
| 18 | තිස්සමහාරාමය, හම්බන්තොට, වැල්ලවාය, මාතර යන නීති ආධාර මධ්‍යස්ථානයන්හි සහභාගීත්වයෙන් වීරවිල පැවති ගොවුන්පුරය ප්‍රදර්ශනය සඳහා නීති ආධාර සායන පැවැත්වීම | 04 |
| 19 | ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් සංවිධානරය කරන ලද රට වෙනුවෙන් එකට සිටිමු වැඩසටහන සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ දායකත්වය | 06 |
| 20 | බලංගොඩ, වැල්ලවාය හා පූගොඩ යන ප්‍රදේශයන්හි සමෘද්ධිලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම තුළින් සමෘද්ධිලාභීන් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම | 03 |

## C. සංවර්ධනාත්මක නීති ආධාර වැඩසටහන්

## C 1 .බන්ධනාගාර රැඳවියන් සඳහා වූ වැඩසටහන

සිරකරුවෝ ද මනුෂ්‍යයෝ ය. මෙම සංකල්පය කෙරෙහි ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාවේ අවධානය 2002 වර්ෂයේ සිට යොමු වී ඇත. ඒ අනුව දීර්ඝ කාලයක් බන්ධනාගාර තුළ ඇප නොමැතිව හෝ ඇප කොන්දේසි අධිකරණයට තෘප්ත කිරීමට නොහැකිව සිටින රැඳවියන්ට නීති ආධාර සැපයීම මෙම වැඩසටහනේ මුඛ්‍ය පරමාර්ථයයි. මේ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව දිවයින පුරා පිහිටි බන්ධනාගාර වල රඳවා තබා ඇති රැඳවියන් සඳහා නීති ආධාර සායන පවත් වමින් අවශ්‍ය තොරතුරු එක් රැස්කර ගැනීම සිදු කරනු ලැබේ. තොරතුරු ලබා ගැනීමෙන් අනතුරුව නීති ආධාර ලබා දීම සඳහා තොරා ගන්නා රැඳවියන්ට ඔවුන්ගේ නඩු කටයුතු වෙනුවෙන් නොමිලේ නීතිඥ සහාය ලබා දීම සිදු කරනවා ඇත. 2019 වර්ෂයේ දී බන්ධනාගාර තුළ නීති සායන 12 ක් පවත්වා ඇත.

## C.2. ආදි වාසීන් සඳහා වූ වැඩසටහන

වසර ගණනාවක ඉතිහාසයකට උරුමකම් කියන ආදිවාසී ප්‍රජාවන් ලෝකයේ විවිධ රටවල ජීවත් වේ. ඇමරිකාවේ රතු ඉන්දියානුවන්, අප්‍රිකාවේ පිග්මීවරු, ඔස්ට්‍රේලියාවේ ඇබෙරිජියන්වරු මෙන්ම ශ්‍රී ලංකාවේ වැදි ජනතාව ද ඒ අතරින් ප්‍රධාන වේ.

ශ්‍රී ලාංකික ඉතිහාසයේ ආදිතම පාර්ශවය නියෝජනය කරනු ලබන මෙම ජනතාව අධ්‍යාපන, ආර්ථික, සෞඛ්‍ය, රැකියා සහ වාස භූමි යන සියලු ආකාරයේ තත්ත්වයන්ගෙන් ප්‍රාථමික අවධියේ පසුවනු ලබන්නෝ ය. නව ලෝකයට ගැලපෙන අයුරින් ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ දී ඔවුන් තුළ නෛතික සාක්ෂරතාවය වර්ධනය කිරීමත් ඔවුන් වෙත නීති ආධාර ලබා දීමත් අත්‍යාවශ්‍ය කාරණයක් බව පෙනේ. එසේම ආදිවාසී ජන ප්‍රජාව ආරක්ෂා කිරීම අප රටේ ඓතිහාසික උරුමයන් ආරක්ෂා කිරීමේ වගකීම ඉෂ්ට කිරීමේ කාර්ය භාරයක් වන්නේ ය.

ආදිවාසී ජන උරුමයන් ආරක්ෂා කිරීම සහ මහජනතාව වෙත ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලබා දී ඇති වරප්‍රසාද ලබා ගැනීමේ ලා වූ යුක්තිය කරා පහසු සහ සමප්‍රවේශය ඇති කිරීමේ යාන්ත්‍රණය බලගැන්වීම සහ වඩා නම්‍යශීලි සහ ඵලදායී නීති ප්‍රතිසංස්කරණ ඇති කිරීමට රාජ්‍ය අවධානය යොමු කිරීම සිදු විය යුතුය. සර්වසාධාරණත්වය සහ සමානාත්මතාවයේ අයිතිවාසිකම් භුක්තිවිඳීමට සෑම සියළු ජන කොට්ඨාශයකටම ඉඩ ප්‍රස්ථාව පුළුල් විය යුතුය. ඉහත කී කාරණා සඳහා රාජ්‍ය අවධානය යොමු කර නීති ප්‍රතිසංස්කරණ සිදු කිරීමට කටයුතු කිරීම මෙම ව්‍යාපෘතියේ මුඛ්‍ය අරමුණයි.

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි ජීවත් වන ආදිවාසීන් හමු වීම මඟින් ඔවුන්ගේ වාස භූමිය, සාම්ප්‍රදායික සිරිත්, ජනජීවිතය, ජීවිකාව, අධ්‍යාපන මට්ටම, වාසස්ථාන හා සම්බන්ධව ඇති වර්තමාන අභියෝග හඳුනා ගැනීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණකි. ඒ අනුව ආදිවාසී ජනතාවගේ එදිනෙදා ජීවිතයට බලපාන නීතිමය ගැටළු පිළිබඳ සාකච්ඡාමය කතිකාවත් නිර්මාණය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණු අතර ප්‍රමුඛත්වය ගනී. එසේම ආදි වාසීන්ගේ උරුම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා නව නීති සම්පාදනය කිරීමට ඇති අවශ්‍යතාවය

පිළිබඳ ගරු අධිකරණ අමාත්‍යතුමා දැනුවත් කර ඇති අතර ඒ පිළිබඳ පර්යේෂණ කටයුතු මෙම වසර තුළ දී සිදු කරන ලදී.

## C.3. <u>විදේශගත ශ්‍රමිකයින් සඳහා වූ වැඩසටහන</u>

ශ්‍රී ලංකාවේ ආර්ථිකයට වඩා වැඩි දායකත්වයක් සපයමින් මෙරටට විදේශ විනිමය ගෙනු එනු ලබන විගමනික ශ්‍රමිකයන්ගේ රැකියා සුරක්ෂිතභාවය, ජීවිත සුරක්ෂිතභාවය පිළිබඳ විශේෂ ආරක්ෂාවක් හා රැකවරණයක් තහවුරු කර ගත යුතුය. ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයින් සංඛ්‍යාත්මකව දිනෙන් දින වැඩිවන අතර ඔවුන්ගේ සුරක්ෂිතභාවයන් වෙනුවෙන් නව නීති ප්‍රතිපාදන ස්ථාපිත කර ඇති අතර ඒ මඟින් නීත්‍යානුකූල නොවන අයුරින් විදේශ ගත වීම වැලැක්වීම කටයුතු කිරීම තුළ විගමණික ශ්‍රමිකයන්ගේ රැකවරණය හා ආරක්ෂාව වඩාත් ස්ථායී වේ. අපගේ විගමණික සේවකයන්ගෙන් වැඩි දෙනෙකු ශ්‍රී ලාංකික කාන්තාවන් වන අතර ඔවුන්ගේ දුගී බව හා අඩු ආදායම් මට්ටම මේ සඳහා පාදකවී ඇත. වැඩි දෙනෙක් මැදපෙරදිග කලාපයේ රැකියාවන්හි නිරත වන නුපුහුණු ශ්‍රමිකයින් ගෘහසේවිකාවන් හා අර්ධ පුහුණු සේවකයින් ය. තාවකාලිකව රැකියා සඳහා විදේශ ගත වන බොහෝමයක් සඳහා ඉතා හොඳ වෙළඳපොලක් හා ඉල්ලීමක් ඇත්තේ මැද පෙර දිග කලාපයේ ය. පුහුණු හා හොඳ තත්ත්වයේ විදේශ ගත ශ්‍රමිකයින් සඳහා වෙළඳපල නැගෙනහිර ආසියාව හා බටහිර ආසියාව කේන්ද්‍ර කොට ව්‍යාප්ත වී ඇත.

ශ්‍රී ලාංකික විදේශ ගත ශ්‍රමික කාන්තාවන් බොහෝ දෙනෙක් මැදපෙර දිග කලාපයේ ගෘහසේවිකාවන් වශයෙන් කටයුතු කරනු ලබයි. මෙම ගෘහසේවිකාවන්ගෙන් වැඩි දෙනෙක් නුපුහුණු හා කාර්යක්ෂම බවින් අඩුවීම හේතුකොටගෙන ඔවුන්ගේ සේවා ස්ථානයන්හි විශාල වශයෙන් ඔවුන්ට හිමි කම්කරු අයිතිවාසිකම් අහිමි වීම්, අපයෝජන, ශාරීරික හා මානසික හිංසන වැනි මානව හිමිකම් කඩ වීම් වල ගොදුරු බවට පත් වී ඇත. එසේම ඇතැම් විගමණික කාන්තාවන් විදේශයන්හිදී අපරාධ හා වැරදි වලට මුහුණ පෑමට සිදු වන අවස්ථාවන් හි දී විශාල අපහසුතාවන්ට පත්වේ. වැඩි දෙනෙක් එම රට වල නීතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව කිසිවක් නොදනී.

ගැටලු වලට මුහුණ පෑ විදේශගත ශ්‍රමිකයින් සඳහා ස්වකීය සේවය මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ. උපදේශන සේවය ලබා දීමෙන් පසුව එම තැනැත්තන් විදේශ කටයුතු අමාත්‍යාංශයේ කොන්සියුලර් අංශය වෙත හෝ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත හෝ අවශ්‍ය අවස්ථාවන්හි දී අධිකරණමය කටයුතු උදෙසා යොමු කිරීමෙන් ස්වකීය කාර්ය භාරය ක්‍රියාත්මක කෙරේ. විදේශගත ශ්‍රමික පවුල් දැනුවත් කිරීමේ වැඩසටහන්, ඔවුන්ගේ තොරතුරු රැස්කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් මට්ටමින් "ගැමි සංසදය" නමැති ප්‍රජා මූල අධීක්ෂණය කිරීම හා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක වෙමින් මෙම ඒකකය කටයුතු කරනු ලැබේ.

## C.4. <u>නීති අධ්‍යාපන වැඩසටහන</u>

### I. විධිමත් නීති අධ්‍යාපන වැඩසටහන

මෙය ශ්‍රී ලංකා නීති විද්‍යාලය සමඟ ඒකබද්ධව ක්‍රියාත්මක වේ. වසරකට නීතිඥවරුන් වශයෙන් දිවුරුම් දෙන ආධුනික නීතිඥයින් පුහුණු කිරීම මෙහි අරමුණ වේ. **මෙම**

**වසරේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ දී එක් කණ්ඩායම් වශයෙන් ආධුනික නීතිඥවරුන් 275 දෙනෙකු** පුහුණු කොට ඇති අතර ඒ සඳහා ජ්‍යෙෂ්ඨ ප්‍රවීණ විද්වත් ජනාධිපති නීතිඥවරුන් ඇතුළු සම්පත් දායකයින්ගේ බාහිර සේවය කොමිෂන් සභාව විසින් ලබා ගෙන තිබේ.

II. නොවිධිමත් නීති අධ්‍යාපන වැඩසටහන

මහජනතාවට නීතිය පිළිබඳව අධ්‍යාපනය ලබා දීම සඳහා පාඨමාලවක් වශයෙන් සිදු කර ඇති වැඩසටහනකි. මෙහි දී විවිධ වයස් මට්ටම් වල විවිධ ක්ෂේත්‍ර වල නිරත වන මහජනතාවට මාස 04 ක අධ්‍යයන පාඨමාලවක් අධ්‍යයනයෙන් අනතුරුව විභාගයක් පවත්වා සහතික පත්‍රයක් ප්‍රධානය කිරීම සිදු කරනු ලැබේ. **මෙම වසර තුළ දී 52 දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් වෙනුවෙන් මෙම නීති අධ්‍යාපන පාඨමාලාව පවත්වා ඇත.**

## C.5. <u>මුඩුක්කු හා පැල්පත් වාසීන් අරමුණු කොට සිදු කරනු ලැබූ වැඩසටහන්.</u>

වර්ෂා අවස්ථාවන්හි දී කොළඹ නගරය දැඩි සේ ජලයෙන් යටවීම නිසා එකී ජලය පහසුවෙන් කැළණි ගඟට ගලාගෙන යාම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලැබූ ව්‍යාපෘතිය හේතුවෙන් කොළඹ නාගරික ජනතාවගේ නිවාස හා දේපළ රජයට අත්පත් කර ගැනීමටත් ඒ වෙනුවෙන් වන්දි ලබා දීම සිදු කරන අවස්ථාවන්හි දී තමාගේ අයිතිවාසිකම් පිළිබඳ පැහැදිලි සාක්ෂි ඉදිරිපත් කිරීමට නොහැකි වූ ප්‍රජාව වෙනුවෙන් ගරු අධිකරණයේ නඩු කටයුතු පවරා රජයේ වන්දි ලබා ගැනීමට අවශ්‍ය දැනුවත් කිරීම වෙනුවෙන් එක් වැඩසටහන් සිදු කරන ලදී. මෙම වැඩසටහනෙන් අනතුරුව ගරු අධිකරණයෙන් එක් පුද්ගලයෙක් වෙනුවෙන් නඩු පවරා පවත්වාගෙන යාමට නීති ආධාර කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලදී.

## C.6. <u>තොරතුරු දැන ගැනීමේ පනත යටතේ සිදු කරනු ලැබූ වැඩසටහන්.</u>

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ පනතේ 23(1) (අ) වගන්තිය ප්‍රකාරව පනත ක්‍රියාත්මක වීම ආරම්භ වී මාස 03 ක් ඇතුලත සියලුම රජයේ ආයතන විසින් සිය ආයතනය තුල තොරතුරු නිලධාරියෙක් සහ අභියාචනා නිලධාරියෙක් පත් කළ යුතු විය. ඒ අනුව නීති ආධාර කොමිෂන් සභාවේ පහත නම් සඳහන් නිළධාරීන් තොරතුරු නිලධාරි සහ අභියාචනා නිලධාරි වශයෙන් පත් කරන ලදී.

නීතීඥ තාමරශී වික්‍රමනායක මිය - තොරතුරු නිලධාරී ලෙසද

නීතීඥ පියුමි කුමාරි සමරසිංහ මිය - අභියාචනා නිලධාරී ලෙසද පත් කරන ලදී.

තොරතුරු දැනගැනීමේ පනත පිළිබඳව දිවයිනේ විවිධ පලාත්වල නීතිඥවරුන්, රජයේ නිලධාරීන් හා විශ්ව විද්‍යාල ශිෂ්‍යයන් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් 08 ක් මෙම වසර තුළ දී පවත්වා ඇත.

මෙම වැඩසටහන සඳහා UNDP ආයතනය මූල්‍ය අනුග්‍රහය ලබා දී ඇත.

## 1.3.3 <u>ව්‍යාපෘති සඳහා මූල්‍ය අනුග්‍රහය</u>

ඒකාබද්ධ අරමුදල, U.N.D.P. ආයතනය මඟින් මූල්‍ය අනුග්‍රහය ලබා දී ඇති අතර ඒවා නීති ආධාර අරමුදලට බැර කර මෙම ව්‍යාපෘති අංශයේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

| | වැඩසටහන | වැඩසටහන් ගණන | මූල්‍ය අනුග්‍රහය |
|---|---|---|---|
| 01 | නෛතික දැනුම ලබා දීම, අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, වරප්‍රසාද ලබා ගැනීමට සහයෝගය දැක්වීම උදෙසා ළමයින්, කාන්තාවන්, වැඩිහිටියන් හා ආබාධිත ප්‍රජාව කේන්ද්‍ර කොට ගනිමින් පැවැත් වූ වැඩසටහන් | 38 | ඒකාබද්ධ අරමුදල |
| 02 | නෛතික දැනුම ලබා දීම තුළින් ගුණාත්මක සහ කාර්යක්ෂම රාජ්‍ය යාන්ත්‍රණයක් සකස් කිරීමෙන් මහජනතාවට යුක්තිය කරා පහසුවෙන් ප්‍රවේශ වීමේ අපේක්ෂාව පෙර දැරිව රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 12 | ඒකාබද්ධ අරමුදල |
| 03 | ආරාධිත දේශන හා නීති උපදේශන මඟින් සම්පත් දායකත්වය ලබා දුන් වැඩසටහන් | 79 | ඒකාබද්ධ අරමුදල |
| 04 | වතුකම්කරුවන්, ධීවර ප්‍රජාව, මුඩුක්කු හා පැල්පත් වාසීන් අරමුණු කොට සිදු කරනු ලැබූ වැඩසටහන් (නාගරික සංවර්ධන අධිකාරිය සමඟ කරන ලදී) | 01 | නාගරික සංවර්ධන අධිකාරිය |
| 05 | බන්ධනාගාර වැඩසටහන් | 12 | ඒකාබද්ධ අරමුදල |
| 06 | ග්‍රාමීය ජ්‍රාව දැනුවත් කිරීම | 28 | ඒකාබද්ධ අරමුදල |
| 07 | නීති ආධාර සායන | 28 | ඒකාබද්ධ අරමුදල |
| 08 | ආධුනික නීතිඥවරුන් පුහුණු කිරීමේ වැඩමුළු | 01 | ඒකාබද්ධ අරමුදල |
| 09 | මතින් නිදහස් රටක් නිර්මාණය කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ මෙහෙයවීම මත මත්ද්‍රව්‍ය, නිවාරණය, හා ප්‍රතිකාර යන මැයෙන් මත්ද්‍රව්‍යයන් සඳහා ඇබ්බැහි වූ පවුල්වන සාමාජිකයින් නීතිමය හා වෛද්‍යමය වශයෙන් දැනුවත් කිරීම | 04 | ඒකාබද්ධ අරමුදල |
| 10 | තොරතුරු දැනගැනීමේ පනත සම්බන්ධයෙන් වන වැඩසටහන් (පොලීසිය, ග්‍රාම නිලධාරීන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් කොළඹ මහනගර සභාවේ නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු විධායක නිලධාරීන්, විදුලි ඉංජිනේරුවරුන්, විශ්ව විද්‍යාල සිසුන්, වැඩිහිටි ප්‍රජාව වෙත මෙම වැඩසටහන් දියත් කරන ලදී.) | 08 | U.N.D.P. ආයතනය |
| 11 | අධිකරණ අමාත්‍යාංශය හා නීති ආධාර කොමිෂන් සභාව එක්ව සංවිධානය කරනු ලබන රට වෙනුවෙන් එකට සිටිමු යන වැඩසටහනේ ආබාධිත ප්‍රජාව හා වැඩිහිටි ප්‍රජාව සම්බන්ධයෙන් මඩකලපුව දිස්ත්‍රික්කයේ සිදු කල වැඩසටහන් | 05 | ඒකාබද්ධ අරමුදල |
| 12 | අග්‍රාමාත්‍ය කාර්යාලය මඟින් රාජ්‍ය සේවය ගමට යන තේමාව යටතේ සිදු කරනු ලබන වැඩසටහන් මාලාවේ මාතලේ දිස්ත්‍රික්කයේ වැඩසටහන් සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥවරුන්ගේ සම්පත් දායකත්වය ලබා දීම | 08 | ඒකාබද්ධ අරමුදල |
| 13 | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොළඹ, ගම්පහ, රත්නපුර, කළුතර දිස්ත්‍රික්ක වල සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 03 | ඒකාබද්ධ අරමුදල |
| 14 | කාන්තා දිනයට සමගාමීව මාර්තු මාසය තුළදී කාන්තාවන් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 07 | ඒකාබද්ධ අරමුදල |
| 15 | වයඹ විශ්ව විද්‍යාල සංවත්සරික වෙනුවෙන් කරන ලද අධ්‍යාපනික ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන කුටියක් පැවැත්වීම | 01 | ඒකාබද්ධ අරමුදල |
| 16 | ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ දායකත්වය ලබා දීම | 06 | ඒකාබද්ධ අරමුදල |
| 17 | එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා වැඩසටහන සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ | 02 | ඒකාබද්ධ අරමුදල |

| | | | |
|---|---|---|---|
| | සහභාගීත්වය | | |
| 18 | තිස්සමහාරාමය, හම්බන්තොට, වැල්ලවාය, මාතර යන නීති ආධාර මධ්‍යස්ථානයන්හි සහභාගීත්වයෙන් විරවිල පැවති යොවුන්පුරය ප්‍රදර්ශනය සඳහා නීති ආධාර සායන පැවැත්වීම | 04 | ඒකාබද්ධ අරමුදල |
| 19 | ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් සංවිධානරය කරන ලද රට වෙනුවෙන් එකට සිටිමු වැඩසටහන සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ දායකත්වය | 06 | ඒකාබද්ධ අරමුදල |
| 20 | බලංගොඩ, වැල්ලවාය හා පූගොඩ යන ප්‍රදේශයන්හි සමෘද්ධිලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම තුළින් සමෘද්ධිලාභීන් නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීම | 03 | ඒකාබද්ධ අරමුදල |

## 1.3.5 වැඩසටහන් සඳහා මූල්‍ය ආයෝජනය ලබා දීම.

| අනු අංකය | මූල්‍ය අනුග්‍රහය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ඒකාබද්ධ අරමුදල | 247 |
| 02 | U.N.D.P. ආයතනය | 08 |
| 03 | වෙනත් | 1 |
| එකතුව | | 256 |

## 1.3.4 2019 වර්ෂයේ ඒකාබද්ධ අරමුදල මඟින් ආයතනික මට්ටමින් වැඩසටහන් මෙහයවීම විශ්ලේෂණාත්මකව

| අනු අංකය | මධ්‍යස්ථානය | දිනය | පැවැත්වූ ස්ථානය හා වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | වියදම |
|---|---|---|---|---|---|
| 01 | කන්තලේ | 2019.09.21 | ධීවරගම ප්‍රජා ශාලාව | 73 | 40,000/- |
| 02 | වරකපොල | 2019.10.02 | තුල්හිරිය රජමහ විහාරය වැඩිහිටියන් සහ කාන්තාවන් දැනුවත් කිරීම | 80 | 18,130/- |
| 03 | ගලගෙදර | 2019.09.29 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පූජාපිටිය වැඩිහිටියන් සහ කාන්තාවන් දැනුවත් කිරීම | 130 | 40,000/- |
| 04 | නුගේගොඩ | 2019.12.10 | පොලිස් ස්ථානය, මිරිහාන රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 91 | 46,260/- |
| 05 | කුලියාපිටිය | 2019.09.05 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කුලියාපිටිය රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 144 | 37,029/- |
| 06 | මඩකලපුව | 2019.09.21 | කාන්තාවන් දැනුවත් කිරීම, මඩකලපුව | 72 | 40,000/- |
| 07 | තිස්සමහාරාමය | 2019.09.23 | ප්‍රජා ශාලාව, මාගම තිස්සමහාරාමය වැඩිහිටියන් දැනුවත් කිරීම | 57 | 20,000 |
| | | 2019.09.25 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තිස්සමහාරාමය | 52 | 20,000 |
| 08 | නාවලපිටිය | 2019.09.21 | ශ්‍රී සුදර්ම පන්සල | 50 | 40,000/- |
| 09 | දඹුල්ල | 2019.09.29 | අතුපරයාය පන්සල, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුවත් කිරීම | 92 | 37,039/- |
| 10 | ගල්ගමුව | 2019.09.28 | පොලිස් ස්ථානය, ගිරිබාග වැඩිහිටියන් සහ කාන්තාවන් දැනුවත් කිරීම | 85 | 40,000/- |
| 11 | වාරියපොල | 2019.09.21 | වෙදවුන්ගල ශෛලතාරාම රජමහවිහාරය, හිදගහවැව, බන්ඩාරකොස්වත්ත වැඩිහිටියන් සහ කාන්තාවන් දැනුවත් කිරීම | 110 | 39,981/- |
| 12 | දෙයියන්දර | 2019.09.01 | ප්‍රජා ශාලාව, පට්ටිගල | 39 | 39,235/- |

| | | | | | |
|---|---|---|---|---|---|
| 13 | වාලවිවේනය | 2019.10.06 | ඔඩ්ඩමාවඩි<br>පාසල් ළමුන් දැනුවත් කිරීම | 72 | 40,000/- |
| 14 | දෙහිඅත්තකණ්ඩිය | 2019.09.19 | කුඩගල පාසල, කුඩගල<br>පාසල් ළමුන්, ගුරුවරුන් හා දෙමාපියන්<br>දැනුවත් කිරීම | 130 | 33,620/- |
| 15 | පොතුවිල් | 2019.10.05 | අක්-අල් ඉෆ්රන් කාන්තා පාසල, පොතුවිල්<br>පාසල් ළමුන් දැනුවත් කිරීම | 60 | 39,949/- |
| 16 | මතුගම | 2019.09.03 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මතුගම | 94 | 39,933/- |
| 17 | කළුතර | 2019.03.25 | කළුතර, කාන්තාවන් දැනුවත් කිරීම | 75 | 21,200/- |
| | | 2019.09.30 | කදනගොඩ<br>මහජනතාව දැනුවත් කිරීම | 100 | 40,000/- |
| 18 | මාතර | 2019.03.30 | වීවරවිල, තරුණ ප්‍රජාව දැනුවත් කිරීම | 50 | 2,540/- |
| | | 2019.08.20 | රදම්පල පන්සල<br>මහජනතාව දැනුවත් කිරීම | 140 | 38,503/- |
| 19 | මහියංගනය | 2019.09.28 | ශ්‍රී ධර්මරාජ විහාරස්ථානය<br>මහජනතාව දැනුවත් කිරීම | 107 | 39,915/- |
| 20 | කල්මුනේ | 2019.03.08 | මහාධිකරණ සංකීර්ණය, කල්මුනේ<br>අධිකරණ නිලධාරීන් දැනුවත් කිරීම | 90 | 14,247/- |
| | | 2019.09.07 | ප්‍රාදේශීය සභාව, සමන්තුරේ<br>මහජනතාව දැනුවත් කිරීම | 130 | 35,282/- |
| 21 | පූගොඩ | 2019.08.08 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කිරිදිවැල<br>සමෘද්ධි සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම | 88 | 46,000/- |
| | | 2019.10.05 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කිරිදවැල<br>වැඩිහිටියන් හා ආබාධිත පුද්ගලයන්<br>දැනුවත් කිරීම | 139 | 40,000/- |
| 22 | මාවනැල්ල | 2019.09.27 | කළුගල විහාරස්ථානය<br>මහජනතාව දැනුවත් කිරීම | 49 | 12,652/- |
| 23 | හම්බන්තොට | 2019.10.09 | බන්ධානාගාරය, අහුණුකොලපැලැස්ස<br>බන්ධානාගාර රැඳවියන් දැනුවත් කිරීම | 100 | 12,200/- |
| | | 2019.09.21 | හම්බන්තොට පල්ලිය | 100 | 40,170/- |
| 24 | සියඹලාණ්ඩුව | 2019.09.25 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>සියඹලාණ්ඩුව<br>මහජනතාව දැනුවත් කිරීම | 150 | 24,100/- |
| 25 | කැබිතිගොල්ලෑව | 2019.09.21 | කන්ගොල්ලෑව | 100 | 40,000/- |
| 26 | තංගල්ල | 2019.09.17 | මහජන සෞඛ්‍ය පරීක්ෂණ කාර්යාලය,<br>තංගල්ල - රාජ්‍ය නිලධාරීන් හා කාන්තාවන්<br>දැනුවත් කිරීම | 82 | 40,025/- |
| | | 2019.09.10 | බන්ධනාගාරය, අහුණුකොලපැලැස්ස<br>බන්ධනාගාර රැඳවියන් දැනුවත් කිරීම | 30 | 8,505/- |
| 27 | පේදුරුතුඩුව | 2019.09.21 | තුනාලි නැගෙනහිර<br>මහජනතාව දැනුවත් කිරීම | 69 | 39,500/- |
| 28 | කැකිරාව | 2019.01.14 | මහජන සෞඛ්‍ය පරීක්ෂණ කාර්යාලය,<br>කැකිරාව<br>දොස්තරවරුන්, හෙද නිලධාරීන්, පවුල්<br>සෞඛ්‍ය නිලධාරීන්, මහජන සෞඛ්‍ය<br>පරීක්ෂණ නිලධාරීන් දැනුවත් කිරීම | 50 | 40,000/- |
| | | 2019.09.21 | උස්ගල<br>සිවිල් වැසියන් දැනුවත් කිරීම | 90 | 36,360/- |
| 29 | අවිස්සාවේල්ල | 2019.09.19 | දැනුවත් කිරීමේ වැඩසටහන<br>පාසල් ළමුන් දැනුවත් කිරීම | 150 | 27,640/- |
| 30 | මුලයිතිව් | 2019.09.26 | මුලතිව් කලපාය | 46 | 29,824.50/- |
| 31 | මන්නාරම | 2019.10.05 | මුසාලි ජාතික පාසල | 110 | 47,200/- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | පාසැල් ළමුන් දැනුවත් කිරීම | | |
| 32 | මහව | 2019.09.29 | වීරසන්ගිලියාගම<br>වැඩිහිටියන් දැනුවත් කිරීම | 54 | 38,728/- |
| 33 | අත්තනගල්ල | 2019.02.10 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අත්තනගල්ල<br>රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 111 | 39,850/- |
| 34 | හොරණ | 2019.09.07 | බන්ධනාගාරය, කළුතර<br>බන්ධනාගාර රැඳවියන් දැනුවත් කිරීම | 100 | 8,250/- |
| | | 2019.09.28 | විද්‍යාසේකර පිරිවෙන, බෙල්ලපිටිය<br>මහජනතාව දැනුවත් කිරීම | 70 | 39,994/- |
| 35 | වැලිමඩ | 2019.10.25 | අඹගස්දොව උඟවපරණගම | 100 | 42,153/- |
| 36 | බද්දේගම | 2019.09.15 | පනාගල මහබෝදි විද්‍යාලය<br>වැඩිහිටියන් දැනුවත් කිරීම | 75 | 40,000/- |
| 37 | ත්‍රිකුණාමලය | 2019.09.21 | කින්නියා කාන්තා පාසල<br>පාසල් ළමුන් දැනුවත් කිරීම | 95 | 40,000/- |
| 38 | වැල්ලවාය | 2019.08.31 | මල්ලඅත්තාව විහාරස්ථානය<br>මහජනතාව දැනුවත් කිරීම | 10 | 40,000/- |
| 40 | මල්ලාහම් | 2019.09.11 | අතියර් හින්දු විද්‍යාලය<br>පාසල් ළමුන් හා ගුරුවරුන් දැනුවත් | 105 | 39,960/- |
| 41 | මුත්තූර් | 2019.09.07 | අම්මන් නගර් ශාලාව | 102 | 39,450/- |
| 42 | බත්තරමුල්ල | 2019.10.02 | අධිකරණමය නොවන පුහුණු මධ්‍යස්ථානය,<br>පොලිස් නිලධාරීන් පරිවාස නිලධාරීන් සහ<br>අනෙකුත් නිලධාරීන් දැනුවත් කිරීම | 84 | 40,600/- |
| 43 | මාරවිල | 2019.09.16 | මරදවෙල ප්‍රජා ශාලාව<br>මහජනතාව දැනුවත් කිරීම | 102 | 33,850/- |
| 44 | මොනරාගල | 2019.08.11 | බන්ධනාගාරය, මොනරාගල<br>බන්ධානාගර රැඳවියන් දැනුවත් කිරීම | 36 | 16,100/- |
| | | 2019.09.15 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>මහජනතාව දැනුවත් කිරීම | 55 | 40,000/- |
| 45 | බදුල්ල | 2019.09.21 | ශ්‍රී කෙත්තාරාම විහාරස්ථානය<br>මහජනතාව දැනුවත් කිරීම | 80 | 40,000/- |
| 46 | කිලිනොච්චිය | 2019.09.25 | කිලි/රමනතාපුරම් මහා විද්‍යාලය<br>පාසල් ළමුන් දැනුවත් කිරීම | 75 | 38,120/- |
| 47 | යාපනය | 2019.09.25 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>පුහුණු නිලධාරීන් දැනුවත් කිරීම | 70 | 49,370/- |
| 48 | දෙයියන්දර | 2019.10.11 | මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යලය<br>රාජ්‍ය නිලධාරීන් හා කාන්තාවන් දැනුවත් කිරීම | 95 | 40,030/- |
| 49 | වලස්මුල්ල | 2019.09.25 | කනුමුල්දෙනිය මහා විද්‍යාලය<br>පාසල් ළමුන් දැනුවත් කිරීම | 120 | 39,675/- |
| 50 | කඩවත | 2019.09.28 | අභිනවාරාම විහාරස්ථානය<br>මහජනතාව දැනුවත් කිරීම | 113 | 40,003/- |
| 51 | කුරුණෑගල | 2019.09.26 | වයිඑම්බී කුරුණෑගල<br>රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 50 | 40,000/- |
| 52 | මහනුවර | 2019.09.17 | ගල්කැටිය විහාරස්ථානය<br>ආබාධිත පුද්ගලයින් දැනුවත් කිරීම | 143 | 40,000/- |
| 53 | බලපිටිය | 2019.10.05 | බටපොල සමෘද්ධි කාර්යාලය<br>කාන්තා සංවිධානය දැනුවත් කිරීම | 100 | 40,000/- |
| 54 | කඩුවෙල | 2019.08.03 | කොතලාවල මහා විද්‍යාලය<br>ළමුන් දැනුවත් කිරීම | 116 | 25,921/- |
| | | 2019.09.28 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාලඹේ -<br>මහජනතාව දැනුවත් කිරීම | 253 | 184,966/- |

| | | | | | |
|---|---|---|---|---|---|
| 55 | මීගමුව | 2019.08.03 | අධිකරණ සංකීර්ණය<br>කාන්තා විනිසුරුවරුන් සහ කාන්තා නීතිඥවරුවන් දැනුවත් කිරීම | 25 | 13,400/- |
| 56 | බලංගොඩ | 2019.08.08 | ආර්/බුලත්ගම විද්‍යාලය<br>සිවිල් වැසියන් දැනුවත් කිරීම | 80 | 15,942/- |
| | | 2019.09.15 | ඇල්ලපොල විද්‍යාලය<br>සිවිල් වැසියන් දැනුවත් කිරීම | 82 | 13,510/- |
| 57 | ඇඹිලිපිටිය | 2019.09.12 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඇඹිලිපිටිය<br>ප්‍රජාපාදක විශෝධන මධ්‍යස්ථානය යටතේ සිටින නිලධාරීන් දැනුවත් කිරීම | 100 | 37,500/- |

## 1.3.6 ආරාධිත වැඩසටහන් සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ සහභාගීත්වය

විවිධ ආයතන සහ සමාජ සංවිධාන විසින් ඔවුන් විසින් මෙහය වූ වැඩසටහන් වල සම්පත්දායකත්වය ලබා ගැනීම සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ නිලධාරීන් වෙත කරනු ලැබ ඇති ආරාධනය නීති වෘත්තිය තුළ හා ආයතනික මට්ටමින් අප වෙත ලැබූ සුවිශාල ගෞරවයකි. විවිධ සමාජ සංවිධාන හා ආයතන වල දැනුවත් කිරීමේ වැඩසහටන් වල දේශකයින් වශයෙන් ද, ජංගම සායන වල නීති උපදේශකයින් වශයෙන් ද, වැඩමුළු මෙහෙයවන්නන් වශයෙන් ද, නීති ආධාර කොමිෂන් සභාවේ නීති නිලධාරීන්ගේ දායකත්වය ලබා දීම අධිකරණමය රාජකාරි වලට අමතරව ඔවුන් සිදු කරනු ලැබූ සුවිශාල මෙහෙවරකි. එසේම මෙම ආරාධනා ලබා දුන් ආයතන විසින් නීති ආධාර කොමිෂන් සභාවට ලබා දුන් මෙම ගෞරවය ස්තූති පූර්වකව අගය කරනු ලබයි.

නීති ආධාර කොමිෂන් සභාව විසින් ලබා දෙන සේවාවන්, ලිංගික අතවර, මූලික අයිතිවාසිකම්, ළමා අපයෝජන, කාන්තා අයිතිවාසිකම්, ලිංගික කෲරකම්, වැඩිහිටි තැනැත්තන් වෙනුවෙන් වූ නීති, මිනිස් ජාවාරම, කම්කරු නීති, ඉඩම් නීති සහ සිවිල් ලේඛන, එදිනෙදා ජීවිතයට අවශ්‍ය සාමාජීය ප්‍රශ්න අලලා වූ නීතිමය තත්ත්ව, පවුල් නීතිය, යුද්ධයෙන් පීඩිත වූ කාන්තාවන්, මුස්ලිම් කාන්තාවන්, විදේශගත ශ්‍රමික කාන්තාවන් සඳහා වූ නීතිමය තත්ත්ව පාදක කොටගෙන සම්පත්දායකත්ව සැපයීම සිදුකොට ඇත.

### 1.3.7 ආරාධිත වැඩසටහන් සඳහා නීති ආධාර කොමිෂන් සභාවේ සහභාගීත්වය

| අනු අංකය | මධ්‍යස්ථානය | දිනය | පැවැත්වූ ස්ථානය හා වැඩසටහන | සහභාගී වූ සංඛ්‍යාව | ආරාධිත වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | කන්තලේ | 2019.01.24 | ක්‍රිස්ටල් මාටින් පුද්ගලික සමාගම | 24 | 05 |
| | | 2019.01.31 | වෙන්දෙසෙන්පුර පන්සල | 35 | |
| | | 2019.02.06 | ක්‍රිස්ටල් මාටින් පුද්ගලික සමාගම | 24 | |
| | | 2019.02.13 | ක්‍රිස්ටල් මාටින් පුද්ගලික සමාගම | 24 | |
| | | 2019.06.27 | මානව හිමිකම් කොමිෂන් සභාව | 50 | |
| 02 | වරකපොල | 2019.03.08 | මාස් පුද්ගලික ආයතනය, තුල්හිරිය<br>ආයතනික සේවකයන් දැනුවත් කිරීම | 50 | 05 |
| | | 2019.09.10 | මාස් පුද්ගලික ආයතනය, තුල්හිරිය<br>ආයතනික සේවකයන් දැනුවත් කිරීම | 40 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 2019.09.16 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොල්ගහවෙල<br>කාන්තා සමිති සාමාජිකයින් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.12.13 | මාස් පුද්ගලික ආයතනය, තුල්හිරිය<br>ආයතනික සේවකයන් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.12.19 | මාස් පුද්ගලික ආයතනය, තුල්හිරිය<br>ආයතනික සේවකයන් දැනුවත් කිරීම | 100 | |
| 03 | ගලගෙදර | 2019.04.04 | ශ්‍රී ධර්මාරාම පිරිවෙන, හතරලියද්ද<br>මහජනතාව දැනුවත් කිරීම | 18 | 02 |
| | | 2019.06.09 | අජ්මීර් පාසල, උකුවෙල<br>මහජනතාව දැනුවත් කිරීම | 10 | |
| 04 | කුලියාපිටිය | 2019.02.28 | කලාප අධ්‍යාපන කාර්යාලය, කුලියාපිටිය<br>පාසල් සංවර්ධන නිලධාරීන් දැනුවත් කිරීම | 100 | 03 |
| | | 2019.03.03 | වයඹ විශ්ව විද්‍යාලය, කුලියාපිටිය<br>මහජනතාව දැනුවත් කිරීම | 9 | |
| | | 2019.10.06 | එපලදෙනිය සණස<br>සණස සාමාජිකයින් දැනුවත් කිරීම | 100 | |
| 05 | මඩකලපුව | 2019.04.08 | මන්මුනෙයි උතුර<br>වැඩිහිටියන් දැනුවත් කිරීම | 102 | 07 |
| | | 2019.04.08 | මන්මුනෙයි නිරිතදිග<br>වැඩිහිටියන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.04.09 | මන්මුනෙයි පත්තු<br>වැඩිහිටියන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.04.09 | පොර්තිව් පත්තු, වැඩිහිටියන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.04.10 | මන්මුනෙයි බස්නාහිර<br>වැඩිහිටියන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.04.10 | එරාවුර් පත්තු, වැඩිහිටියන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.08.29 | මඩකලපුව, රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 30 | |
| 06 | තිස්සමහාරාමය | 2019.09.12 | බන්ධනාගාරය, වීරවිල<br>බන්ධනාගාර රැඳවියන් දැනුවත් කිරීම | 300 | 02 |
| | | 2019.12.17 | ජයගම, තම්මැන්නාව, බෙරලිහේන<br>ග්‍රාම නිලධාරීන් දැනුවත් කිරීම | 40 | |
| 07 | පොලොන්නරුව | 2019.08.01 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොලොන්නරුව<br>ළමුන් දැනුවත් කිරීම | 50 | 04 |
| | | 2019.08.30 | ප්‍රජා විශෝධන මධ්‍යස්ථානය<br>රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 40 | |
| | | 2019.09.04 | බන්ධනාගාරය පොළොන්නරුව<br>බන්ධනාගාර රැඳවියන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.10.03 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොලොන්නරුව<br>ළමුන් දැනුවත් කිරීම | 60 | |
| 08 | නාවලපිටිය | 2019.09.15 | දහම්පාසල් ළමුන් දැනුවත් කිරීම | 60 | 01 |
| 09 | දඹුල්ල | 2019.02.07 | පොලිස් ස්ථානය, දඹුල්ල<br>කාන්තාවන් හා ළමුන් දැනුවත් කිරීම | 50 | 05 |
| | | 2019.03.05 | පොලිස් ස්ථානය, දඹුල්ල<br>කාන්තාවන් හා ළමුන් දැනුවත් කිරීම | 60 | |
| | | 2019.08.28 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තු<br>නිලධාරීන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.09.10 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තු<br>නිලධාරීන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.09.25 | ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තු<br>නිලධාරීන් දැනුවත් කිරීම | 50 | |
| 10 | ගල්කිස්ස | 2019.05.26 | සණස ශ්‍රවණාගාරය, දෙහිවල | 100 | 01 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | මහජනතාව දැනුවත් කිරීම | | |
| 11 | ගල්ගමුව | 2019.01.24 | උස්ගල ගැමුණු මහ විද්‍යාලය<br>ළමුන් දැනුවත් කිරීම | 300 | 02 |
| | | 2019.02.11 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ගල්ගමුව<br>මහජනතාව දැනුවත් කිරීම | 50 | |
| 12 | වාරියපොල | 2019.03.21 | වීරහේනේගෙදර විහාරය, නිදහස් හන්දිය, බමුණුකොටුව<br>ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව<br>පවුල් උපදේශන වැඩසහටන | 22 | 02 |
| | | 2019.10.01 | සමාජ ශාලා ගොඩනැගිල්ල, වැගොල්ල<br>වැඩිහිටියන් දැනුවත් කිරීම | 50 | |
| 13 | දෙයියන්දර | 2019.03.15 | එන්එස්බී මොරවක<br>කාන්තාවන් දැනුවත් කිරීම | 30 | 07 |
| | | 2019.03.25 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පස්ගොඩ | 15 | |
| | | 2019.05.25 | සනායා හෙටෙල්, මාතර<br>නීති නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන්<br>දැනුවත් කිරීම | 30 | |
| | | 2019.07.17 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පස්ගොඩ<br>ග්‍රාමසේවක නිලධාරීන් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.07.18 | බෙරලන්තර සුදර්ශනාරාමය<br>කාන්තාවන් දැනුවත් කිරීම | 40 | |
| | | 2019.08.22 | රොටුම්බ පෙතමග විහාරය<br>කාන්තාවන් දැනුවත් කිරීම | 25 | |
| | | 2019.08.27 | ඌරුබොක්ක නාගරාම විහාරය<br>කාන්තාවන් දැනුවත් කිරීම | 40 | |
| 14 | වාලව්වේනය | 2019.02.11 | වාලව්වේනය, කාන්තාවන් දැනුවත් කිරීම | 50 | 10 |
| | | 2019.04.11 | ඔඩ්ඩමාවඩි, වැඩිහිටියන් දැනුවත් කිරීම | 60 | |
| | | 2019.04.11 | වහරයි, වැඩිහිටියන් දැනුවත් කිරීම | 60 | |
| | | 2019.04.12 | වාලව්වේනය, වැඩිහිටියන් දැනුවත් කිරීම | 60 | |
| | | 2019.06.24 | වාලව්වේනය, කාන්තාවන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.07.10 | වාලව්වේනය, කාන්තාවන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.07.12 | වාලව්වේනය, කාන්තාවන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.07.20 | වාලව්වේනය, කාන්තාවන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.08.31 | වාලව්වේනය, වැඩිහිටියන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.11.08 | වාලව්වේනය, ළමුන් දැනුවත් කිරීම | 50 | |
| 15 | දෙහිඅත්තකණ්ඩිය | 2019.03.12 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>දෙහිඅත්තකණ්ඩිය<br>ප්‍රාදේශීය කමිටු රැස්වීමට සහභාගී වීම<br>කාන්තා දිනය සමගාමීව | 150 | 05 |
| | | 2019.04.09 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>දෙහිඅත්තකණ්ඩිය<br>ප්‍රාදේශීය කමිටු රැස්වීමට සහභාගී වීම | 70 | |
| | | 2019.05.07 | ලිහිනියාගම පාසල, දෙහිඅත්තකණ්ඩිය<br>ගුරුවරුන් සහ දෙමාපියන් සඳහා පැවැත් වූ<br>නීති සායනය | 17 | |
| | | 2019.05.28 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>දෙහිඅත්තකණ්ඩිය<br>ප්‍රාදේශීය කමිටු රැස්වීමට සහභාගී වීම | 60 | |
| | | 2019.10.02 | ලිහිනියාගම පාසල, දෙහිඅත්තකණ්ඩිය<br>ගුරුවරුන් සහ දෙමාපියන් දැනුවත් කිරීම | 40 | |
| 16 | මතුගම | 2019.03.10 | කොස්වත්ත ජනාධිපති විද්‍යාලය,<br>දොඩන්ගොඩ | 50 | 06 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීම | | |
| | | 2019.03.16 | ශ්‍රී ලංකා පදනම් ආයතනය, කොළඹ<br>නීති නිලධාරීන් දැනුවත් කිරීම | 30 | |
| | | 2019.04.30 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පාලින්දනුවර | 50 | |
| | | 2019.05.25 | සනායා හෝටලය, මාතර<br>නීති නිලධාරීන් සහ රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.09.07 | බන්ධනාගාරය, කළුතර<br>බන්ධනාගාර රැඳවියන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.09.21 | ගොල්ෆේස් හෝටලය, කොළඹ<br>නීති නිලධාරීන් දැනුවත් කිරීම | 70 | |
| 17 | කළුතර | 2019.04.23 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කළුතර<br>දිස්ත්‍රික්ක සංවර්ධන කමිටුව | 50 | 10 |
| | | 2019.05.07 | ප්‍රදේශීය ලේකම් කාර්යාලය, දෙරුවල<br>ප්‍රාදේශීය සංවර්ධන කමිටුව | 30 | |
| | | 2019.06.24 | කළුතර එන්අයිඑසඑච්<br>එම්ඕඑච් දොස්තරවරුන් දැනුවත් කිරීම | 60 | |
| | | 2019.07.18 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කළුතර<br>දිස්ත්‍රික්ක සංවර්ධන කමිටුව | 50 | |
| | | 2019.07.25 | කළුතර ශික්ෂණ රෝහල, මිතුරු පියස | 40 | |
| | | 2019.09.06 | බන්ධනාගාරය, කළුතර<br>බන්ධනාගාර රැඳවියන් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.08.26 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, කළුතර<br>දිස්ත්‍රික්ක සංවර්ධන කමිටුව | 50 | |
| | | 2019.10.18 | ග්‍රෑනඩ් බිච් හොටෙල්, කළුතර | 60 | |
| | | 2019.11.11 | කළුතර එන්අයිඑසඑච්<br>එම්ඕඑච් දොස්තරවරුන් දැනුවත් කිරීම | 60 | |
| | | 2019.12.20 | මහජනතාව දැනුවත් කිරීම, පානදුර | 300 | |
| 18 | මාතර | 2019.02.27 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, මාතර<br>ග්‍රාමීය ජනතාව දැනුවත් කිරීම | 50 | 14 |
| | | 2019.03.09 | රුහුණු සේවය, ගුවන්විදුලි වැඩසටහන | රුහුණු සේවය | |
| | | 2019.03.11 | මාස් පුද්ගලික ආයතනය, මිද්දෙනිය<br>ඇඟලුම් සේවකයින් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.03.29 | කොටිකාගොඩ පන්සල<br>මහජනතාව දැනුවත් කිරීම | 70 | |
| | | 2019.05.28 | නාරංගොඩ, මහජනතාව දැනුවත් කිරීම | 50 | |
| | | 2019.06.18 | සර්වෝදය, මහජනතාව දැනුවත් කිරීම | 70 | |
| | | 2019.06.19 | සර්වෝදය, මහජනතාව දැනුවත් කිරීම | 80 | |
| | | 2019.07.06 | දෙනියාය, මහජනතාව දැනුවත් කිරීම | 50 | |
| | | 2019.07.10 | පස්ගොඩ, මහජනතාව දැනුවත් කිරීම | 100 | |
| | | 2019.07.15 | වලස්ගල පන්සල,කාන්තාවන් දැනුවත් කිරී | 80 | |
| | | 2019.07.28 | මොරවක, මහජනතාව දැනුවත් කිරීම | 50 | |
| | | 2019.09.11 | තංගල්ල, මහජනතාව දැනුවත් කිරීම | 100 | |
| | | 2019.10.20 | කපුගොඩ, මහජනතාව දැනුවත් කිරීම | 50 | |
| | | 2019.11.27 | හම්බන්තොට, මහජනතාව දැනුවත් කිරීම | 100 | |
| 19 | මහියංගනය | 2019.01.24 | ෂේඩ් ලයින් ක්ලිනික්<br>කර්මාන්ත ශාලා සේවකයින් දැනුවත් කිරීම | 6 | 09 |
| | | 2019.02.28 | ෂේඩ් ලයින් ක්ලිනික්<br>කර්මාන්ත ශාලා සේවකයින් දැනුවත් කිරීම | 7 | |
| | | 2019.03.19 | ෂේඩ් ලයින් ක්ලිනික්<br>කර්මාන්ත ශාලා සේවකයින් දැනුවත් කිරීම | 3 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 2019.05.15 | ෂේඩ් ලයින් ක්ලිනික්<br>කර්මාන්ත ශාලා සේවකයින් දැනුවත් කිරීම | 6 | |
| | | 2019.07.18 | ෂේඩ් ලයින් ක්ලිනික්<br>කර්මාන්ත ශාලා සේවකයින් දැනුවත් කිරීම | 3 | |
| | | 2019.08.28 | ෂේඩ් ලයින් ක්ලිනික්<br>කර්මාන්ත ශාලා සේවකයින් දැනුවත් කිරීම | 10 | |
| | | 2019.10.02 | ෂේඩ් ලයින් ක්ලිනික්<br>කර්මාන්ත ශාලා සේවකයින් දැනුවත් කිරීම | 10 | |
| | | 2019.11.13 | ෂේඩ් ලයින් ක්ලිනික්<br>කර්මාන්ත ශාලා සේවකයින් දැනුවත් කිරීම | 5 | |
| | | 2019.12.10 | ෂේඩ් ලයින් ක්ලිනික්<br>කර්මාන්ත ශාලා සේවකයින් දැනුවත් කිරීම | 2 | |
| 20 | කල්මුනේ | 2019.01.04 | මහාධිකරණය, කල්මුනේ<br>අධිකරණ කමිටු රැස්වීම | 20 | 19 |
| | | 2019.01.29 | අල්- ජලල් විද්‍යාලය, සයින්දමරුදු<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 50 | |
| | | 2019.01.31 | මානව හිමිකම් කොමිෂන් සභාව, කල්මුනේ<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 45 | |
| | | 2019.02.05 | ප්‍රාදේශීය ලෙක්ම් කාර්යාලය, කරයිතිව්<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 35 | |
| | | 2019.03.28 | මහාධිකරණය, කල්මුනේ<br>අධිකරණ කමිටු රැස්වීම | 25 | |
| | | 2019.04.09 | මානව හිමිකම් කොමිෂන් සභාව, කල්මුනේ<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 45 | |
| | | 2019.04.11 | ප්‍රාදේශීය ලෙක්ම් කාර්යාලය, සම්තුරේ<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 28 | |
| | | 2019.05.10 | ප්‍රාදේශීය ලෙක්ම් කාර්යාලය, සම්තුරේ<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 35 | |
| | | 2019.05.23 | මානව හිමිකම් කොමිෂන් සභාව, කල්මුනේ<br>දැනුවත් කිරීමේ වැඩසටහන | 45 | |
| | | 2019.05.24 | මානව හිමිකම් කොමිෂන් සභාව, කල්මුනේ<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 30 | |
| | | 2019.06.13 | මහාධිකරණය, කල්මුනේ<br>අධිකරණ කමිටු රැස්වීම | 30 | |
| | | 2019.07.23 | ප්‍රාදේශීය ලෙක්ම් කාර්යාලය, කරයිතිව්<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 50 | |
| | | 2019.08.01 | මානව හිමිකම් කොමිෂන් සභාව, කල්මුනේ<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 45 | |
| | | 2019.08.26 | ප්‍රාදේශීය ලෙක්ම් කාර්යාලය, කරයිතිව්<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 30 | |
| | | 2019.09.12 | මහාධිකරණය, කල්මුනේ<br>අධිකරණ කමිටු රැස්වීම | 35 | |
| | | 2019.09.26 | අල් හිදායා මහ විද්‍යාලය<br>පාසල් ළමුන් දැනුවත් කිරීම | 70 | |
| | | 2019.09.26 | මානව හිමිකම් කොමිෂන් සභාව, කල්මුනේ<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 55 | |
| | | 2019.10.21 | ප්‍රාදේශීය ලෙක්ම් කාර්යාලය, සම්තුරේ<br>ප්‍රාදේශීය කමිටු රැස්වීම | 25 | |
| | | 2019.11.28 | මහාධිකරණය, කල්මුනේ<br>අධිකරණ කමිටු රැස්වීම | 35 | |
| 21 | හම්බන්තොට | 2019.08.03 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 100 | 08 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 2019.03.16 | ශ්‍රී ලංකා පදනම් ආයතනය<br>නීති නිලධාරීන් දැනුවත් කිරීම | 50 | |
| | | 2019.03.21 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හම්බන්තොට | 100 | |
| | | 2019.03.28 | වීරවිල යෞවුන් පරපුර<br>මහජනතාව දැනුවත් කිරීම | 1000 | |
| | | 2019.04.03 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, සූරියවැව | 50 | |
| | | 2019.08.16 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හම්බන්තොට | 50 | |
| | | 2019.10.12 | නීති නිලධාරීන් දැනුවත් කිරීම | 20 | |
| | | 2019.12.27 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 50 | |
| 22 | සියඹලාණ්ඩුව | 2019.07.27 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වැල්ලවාය<br>ළමුන් දැනුවත් කිරීම | 100 | 04 |
| | | 2019.07.06 | සබරගමුව විශ්ව විද්‍යාලය<br>විශ්ව විද්‍යාල ශිෂ්‍යාවන් දැනුවත් කිරීම | 400 | |
| | | 2019.10.19 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>සියඹලාණ්ඩුව, තරුණ ප්‍රජාව දැනුවත් කිරීම | 100 | |
| | | 2019.11.02 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ලාහුගල<br>තරුණ ප්‍රජාව දැනුවත් කිරීම | 100 | |
| 23 | තංගල්ල | 2019.03.18 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තංගල්ල<br>නිලධාරීන් දැනුවත් කිරීම | 100 | 04 |
| | | 2019.06.24 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තංගල්ල<br>රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 200 | |
| | | 2019.07.01 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හම්බන්තොට<br>රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.08.21 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, තංගල්ල | 20 | |
| 24 | පේදුරුතුඩුව | 2019.09.07 | යාපනය, මහජනතාව දැනුවත් කිරීම | 50 | 01 |
| 25 | පානදුර | 2019.01.09 | ශාන්ත කුමරු විද්‍යාලය, මොරටුව<br>පාසල් ළමුන් හා දෙමාපියන් දැනුවත් කිරීම | 200 | 69 |
| | | 2019.01.10 | පොලිස් විද්‍යාලය, කළුතර<br>පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.01.14 | සිරස නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සිරස | |
| | | 2019.01.14 | ටීවී දෙරණ, මහජනතාව දැනුවත් කිරීම | දෙරණ | |
| | | 2019.01.30 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.02.06 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.02.20 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.02.22 | ටීවී දෙරණ, මහජනතාව දැනුවත් කිරීම | ටීවී දෙරණ | |
| | | 2019.03.05 | ශාන්ත කුමරු විද්‍යාලය, මොරටුව<br>පාසල් ළමුන් දැනුවත් කිරීම | 200 | |
| | | 2019.03.05 | ශ්‍රද්ධා නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | ශ්‍රද්ධා | |
| | | 2019.03.08 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.03.08 | ලුනාවා කාන්තා සංවිධානය, මොරටුව<br>කාන්තාවන් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.03.13 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.03.14 | පොලිස් විද්‍යාලය, කළුතර<br>පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.03.19 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පුත්තලම<br>මහජනතාව දැනුවත් කිරීම | 50 | |
| | | 2019.03.25 | පොලිස් විද්‍යාලය, කළුතර<br>පොලිස් නිලධාරීන් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.03.27 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | | සිරස නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සිරස | |
| | | 2019.03.29 | සිරස නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සිරස | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | 2019.04.03 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.04.08 | ලුනාවා කාන්තා සංවිධානය, මොරටුව කාන්තාවන් දැනුවත් කිරීම | 100 | |
| | | 2019.04.10 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.04.24 | අයිටීඑන් නාලිකාව, මහජනතාව දැනුවත් | අයිටීඑන් | |
| | | 2019.05.08 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.05.15 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.05.16 | චැනල් සී නාලිකාව, මහජනතාව දැනුවත් | චැනල් සී | |
| | | 2019.05.22 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.05.29 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.06.12 | අයිටීඑන් නාලිකාව, මහජනතාව දැනුවත් | අයිටීඑන් | |
| | | 2019.06.19 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.06.26 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.07.03 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.07.10 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
| | | 2019.07.12 | සිරස නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සිරස | |
| | | 2019.07.17 | සියත නාලිකාව, මහජනතාව දැනුවත් කිරීම | සියත | |
